දිවි අහිමි කරගැනීම් යනු සමාජ ගැටළුවක් බැවින්, ඒ සම්බන්ධයෙන් සමාජය යහපත් ලෙසින් දැනුවත් කිරීම අවශ්‍ය වේ. කෙසේ නමුත් දිවි අහිමි කරගැනීම් වාර්තා කිරීමේදී මාධ්‍ය වලට අතිශයින්ම ප්‍රවේසම් වීමට සිදුවන්නේ, දිවි අහිමි කරගැනීම්ද රැල්ලක් ලෙසින් පැතිර යා හැකි බව පර්යේෂණ මගින් පෙන්වා දෙන බැවිනි. උදාහරණ ලෙසින් දක්වන්නේ නම්, යමෙකු දිවි අහිමි කරගත් ආකාරය දැක්වීම ඔස්සේ දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුට ඒ සඳහා පෙළඹවීමක් ඇතිවීමට හැකියාවක් තිබීම නොසලකා හැරිය හැකි නොවේ. මීට අමතරව දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් සමගින් හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරා ගැනීමට ඉන් ඉඩක් ලැබෙනු ඇත.

මූලාශ්‍ර:

https://www.who.int/news-room/fact-sheets/detail/suicide

https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...

හදිසි උපකාරක අංක:

*1333-CCCline

* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666

*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna